[library stamp]

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2005/2006

ගිවිසුම් සහ නියෝජ්‍යත්ව නීතිය - LWU 2311

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.03.17 වේලාව - ප.ව.01.30 -පව.04.30 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.*

1 වන කොටස - නියෝජ්‍යත්ව නීතිය

මෙම කොටසින් එක් ප්‍රශ්නයක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) විසඳී ඇති නඩු තීර්ණ අනුසාරයෙන් නියෝජ්‍යත්ව නීතියෙහි 'අවශ්‍ය අධිකාරය' නමැති මූලධර්මය පැහැදිලි කරන්න.

(ආ) නියෝජ්‍යත්ව නීතිය කෙරෙහි බලපාන විට, ප්‍රතිබන්ධන මූලධර්මයෙහි **(Doctrine of Estoppel)** අර්ථය කෙටියෙන් සාකච්ඡා කරන්න.

02. (අ) නියෝජ්‍යත්ව නීතිය සම්බන්ධයෙන් "පවරන ලද බලය යළි පැවරිය නොහැකිය" යන ආප්තෝපදේශය අදාලවීම සාකච්ඡා කරන්න.

(ආ) සරත් විසින් තම කාරය විකිණිය හැකි උපරිම මිලට විකිණීම පිණිස, කාර් විකිණීම පිළිබඳ විශේෂඥ සමාගමක් වූ ඔලිම්පික් මෝටර්ස් ආයතනය යොදා ගනී. සරත්ට නොදැනුවත්වම, ඔලිම්පික් මෝටර්ස් ආයතනය විසින් නිමල් නමැති අකාර්යක්ෂම තැරැව්කරුවකුට මෙම කාර්යය පවරන ලදී. සුදුසු ගැනුම්කරුවන් සෙවීමට නිමල් අපොහොසත් වූ හෙයින්, පසුව එම වාහනය පාඩු ලබමින් විකිණීමට සිදු විය. සරත්ට උපදෙස් දෙන්න.

03. එළිදරව්කරන ලද ප්‍රධානියා සහ එළිදරව් නොකරන ලද ප්‍රධානියා යන සිද්ධාන්ත දෙක අතර ඇති වෙනස්කම් දක්වමින්, තෙවන පාර්ශ්වකරුවකුට විරුද්ධව ප්‍රධානියෙකුට ඇති අයිතීන් සඳහන් කරන්න.

## 2 වන කොටස - ගිවිසුම් නීතිය

මෙම කොටසින් ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.

04. බදාදා දිනෙක, ටොන් එකක් රුපියල් 5000 බැගින් තිරිඟු පිටි ටොන් 200 ක් ජිනසේනට විකිණීමට ගුණපාල අර්පණය කරයි. ජිනසේන වෙත කරන ලද අර්පණයේ මෙසේ සඳහන් වේ. අද දවල් මධ්‍යාහ්නය වන විට දුරකථනය මගින් ඔබගේ ප්‍රතිග්‍රහණය කරුණාකර දන්වන්න. භාණ්ඩ භාරදීම ලබන සඳුදා සිදුවනු ඇත. ජිනසේන විසින් තම ප්‍රතිග්‍රහනය දන්වමින් පෙ.ව. 10.00 ට ෆැක්ස් (fax) පණිවුඩයක් යවයි. මෙම ෆැක්ස් පණිවුඩය ගුණපාලට යැවුණු බව එම ෆැක්ස් යන්ත්‍රය මගින් නිකුත් කරන කුවිතාන්සියෙන් ජිනසේනගේ ලිපිකාර සහායකට දැනගැනීමට ලැබේ. අවාසනාවකට මෙන් ගුණපාලගේ ෆැක්ස් යන්ත්‍රයේ නව මුද්‍රණ කාට්රිජයක් (New Printing Cartridge) සවිකර නොමැති හෙයින්, එම ප්‍රතිග්‍රහණය සඳහන් පණිවුඩය ගුණපාලට නොලැබේ.

ස්ථිර ගිවිසුමක් ගොඩනැගී ඇති බවට ජිනසේන විශ්වාස කරන හෙයින් ද, සඳුදා තමන්ට තිරිඟු පිටි තොගය ලැබෙතැයි අපේක්ෂා කරන හෙයින් ද, පාන්ගෙඩි 10,000ක් ධනපාලට සැපයීමේ ගිවිසුමකට ජිනසේන එළඹේ.

ගුණපාල සමග වගකීම්වලින් බැඳි ගිවිසුමක් පවතීද යන කරුණ සම්බන්ධයෙන් ජිනසේනට උපදෙස් දෙන්න.

පහත සඳහන් අවස්ථාවලදී ඔබේ උපදෙස් වෙනස් වන්නේදැයි පැහැදිළි කරන්න.

(අ) ජිනසේන විසින් තම ප්‍රතිග්‍රහණය ඉල්ලා අස්කර ගැනීමේ පණිවුඩයක් මධ්‍යාහ්නයට ප්‍රථම ෆැක්ස් යන්ත්‍රය මගින් යවන ලදී. එම අවස්ථාව වන විට ගුණපාලගේ ෆැක්ස් යන්ත්‍රය නියමාකාරයෙන් ක්‍රියාකාරී වී තිබිණි.

(ආ) ජිනසේන විසින් තම ප්‍රතිග්‍රහණය අපරභාගයේදී, දුරකථන පණිවුඩයක් මගින් ගුණපාලට දන්වන ලදී.

(ඇ) දුරකථනය මගින් ප්‍රතිග්‍රහණය කිරීමක් නොව, ගුණපාලගේ අර්පණයේ මෙසේ සඳහන් විය. "ඔබගේ ප්‍රතිග්‍රහණය ලියාපදිංචි තැපෑල මගින් මධ්‍යාහ්නයට (noon) ප්‍රථම අප වෙත දන්වන්න." ජිනසේන තම ප්‍රතිග්‍රහණය සඳහන් ලිපිය සාමාන්‍ය තැපෑල මගින් (ordinary post) යවන ලදී. නමුත් මෙම ලිපිය ගුණපාලට කිසිසේත් ලැබුණේ නැත.

05. නඩු නීතිය උපයෝගී කර ගනිමින්, අහිංසක සහ වංචාකාරී අවනිදේශන යන සංකල්ප දෙක විස්තර කරන්න. තවද, පීඩා විඳි පාර්ශ්වකරුවකුට එක් එක් අවනිදේශනයක් යටතේ ලබාගත හැකි ප්‍රතිකර්මද විස්තර කරන්න.

06. නීති විරෝධීභාවයේ ප්‍රතිඵල සම්බන්ධ මූලධර්ම ලතින් ආප්තෝපදේශ දෙකක අඩංගු වී ඇත. ඒවානම්, "කිසිම නඩුවක් දෝෂ සහගත ගණුදෙනුවක් මත පදනම් විය නොහැක යන රීතිය සැකසෙන **ex turpi causa non oritur actio** යන්න සහ වරද සමාන වන විට එහි වාසිය විත්තිකරුට ය යන්න අදහස් කෙරෙන **in pari delicto potier est conditio defendatis** යන්නයි."

මෙය පැහැදිලි කරන්න.

07. ගිවිසුම අසම්පූර්ණ ලෙස ඉටු කිරීම සම්බන්ධව මතුවන ගැටළුවල කටුක ස්වභාවය ලිහිල් කිරීම සඳහා අධිකරණයන් විසින් උපයෝගී කොට ගෙන ඇති රීතීන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

08. "ව්‍යාර්ථවීමේ න්‍යයය යටතේ පාර්ශ්වකරුවන් තවදුරටත් ගිවිසුම ඉටු කිරීමෙන් මුදවා හැරීමේ පදනම වනුයේ, යම් නොවැළැක්විය හැකි සහ බාහිර හේතුවක් නිසා ගිවිසුම තවදුරටත් ඉටු කිරීමට නොහැකිවී එය හදිසි අවසානයකට ගොදුරු වී ඇත්නම්, මෙම හේතුවට එකුදු පාර්ශ්වකරුවෙකුවත් වගකිවයුතු නැත්නම්, ගිවිසුම එකෙනෙහිම අවසන් විය යුතුය. තවද, පාර්ශ්වකරුවන් තම වගකීම්වලින් මුදවා හැරිය යුතුය."

විනිශ්චිත නඩු තීර්ණ සහ මෙම න්‍යායයට පදනම් වී ඇති සිද්ධාන්ත ඇසුරින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

09. (අ) "ත්‍යාගකරුගේ ජීවිත කාලය තුල දෙන ලද ත්‍යාගයක් (ජීවත්ව සිටින්නවුන් අතර ත්‍යාගය) සාමාන්‍ය රීතියක් වශයෙන් අවලංගු කිරීමට නොහැකි වුවද, යම් විශේෂ අවස්ථාවන්හිදී, අධිකරණ ආඥාවක ආධාරයෙන් එවැනි ත්‍යාගයක් අවංලුගු කිරීමට ත්‍යාගකරුට හැකිය."

සාකච්ඡා කරන්න.

UNIVERSITY OF
LIBRARY

(ආ) "මරණාසන්න ත්‍යාගය ගිවිසුමක ස්වභාවයක් හා තෙස්තමේන්තු දායාදයක ස්වභාවයක් උසුලන විශේෂ වර්ගයේ ත්‍යාගයකි."

සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා දෙකක් සම්බන්ධව සටහන් ලියන්න.

(අ) අයුතු බලපෑම (undue influence)
(ආ) වැරදීමකින් අත්සන් කරනු ලැබූ ලියකියවිලි සහ එය තමාගේ ක්‍රියාවක් නොවේය යන ආරක්ෂණය (plea of non est factum)
(ඇ) නිදහස් කිරීම හා අත්හැරීම (release or waiver)
(ඈ) නවීකරණය (novation)
(ඉ) ප්‍රමාණකල අලාභ සහ දණ්ඩනය (liquidated damages and penalty)

- හිමිකම් ඇවිරිණි. -